# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය

# ඇගයීම් වාර්තාව

# 2021

## 04

## සංස්කෘත

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

සියලු ම හිමිකම් ඇවිරිණි.

# පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021

# ඇගයීම් වාර්තාව

# 04 - සංස්කෘත

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

පෙරදී මූලික පිරිවෙන් අවසාන විභාගය ලෙස හැඳින්වූ මෙය 2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ අතර මෙම විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මගක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2021 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා පහක් යටතේ ගොනු කර ඇත.

පිරිවෙන් සාමාන්‍ය පෙළ සංස්කෘත විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මක ව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබාදීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයට ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ , නිගමන හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන් ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්නපත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳව අවබෝධ කර ගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

පිළිතුරු පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය ( Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2024. 07.31

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීමටත් යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවී යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම්  යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ  දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

2018 වර්ෂයේ සිට පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය ලෙස නාම සංශෝධනය වූ මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981 දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227 ක් විභාගය සමත් විය.

පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂය ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය  දෙකෙන් ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින්  පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්. සී. ප්‍රියදර්ශනී<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සංස්කරණය | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන අංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය , බත්තරමුල්ල |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන අංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය බත්තරමුල්ල<br><br>පූජ්‍ය රුපහ ඤාණරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ශාසනවර්ධන මූලික පිරිවෙන<br>මීරිගම |
| පරිගණක පිටපත සැකසුම | : | ජේ. කේ. එච්. නවෝදනී ජයනෙත්ති<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ජී. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

# පටුන


පිටු අංකය

**හැඳින්වීම** **i**

**පෙරවදන** **ii**

**වගු නාමාවලිය හා ප්‍රස්තාර නාමාවලිය** **v**

**1. සංස්කෘත විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 සංස්කෘත විෂය අධ්‍යයනයේ අරමුණු 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 2

**I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 6

2.2. I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) 7

2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 11

2.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 17

**II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 20

3.2 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය 21

3.3 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 21

3.4 II ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය 22

3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු,
ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 23

3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා
පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 40

**4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු** 41

**5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** 42

## වගු නාමාවලිය


| | | පිටු අංකය |
|---|---|---|
| වගුව 1.1 | විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 02 |
| වගුව 1.2 | අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය | 02 |
| වගුව 1.3 | පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව | 03 |
| වගුව 1.4 | ලකුණු ලබාගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව | 04 |
| වගුව 2.1 | I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 11 |
| වගුව 2.2 | I පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 13 |
| වගුව 2.3 | තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය | 14 |
| වගුව 2.4 | තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය එහි පහසුතාව හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව | 16 |


## ප්‍රස්තාර නාමාවලිය


| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | I පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 12 |
| ප්‍රස්තාරය 2.2 | I පත්‍රයේ තේමාව අනුව එක් එක් අයිතමයෙහි පහසුතා දර්ශකය | 15 |
| ප්‍රස්තාරය 2.3 | I පත්‍රය - තේමා අනුව පහසුතාව හා ඉදිරිපත් වී ඇති ප්‍රශ්න ප්‍රතිශතය | 16 |
| ප්‍රස්තාරය 3.1 | II පත්‍රය - ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 21 |
| ප්‍රස්තාරය 3.2 | II පත්‍රය - ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 21 |
| ප්‍රස්තාරය 3.3 | II පත්‍රයේ ප්‍රශ්නවල පහසුතා දර්ශකය | 22 |
| ප්‍රස්තාරය 3.4 (a) | 1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 23 |
| ප්‍රස්තාරය 3.4 (b) | 1 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 24 |
| ප්‍රස්තාරය 3.5 (a) | 2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 25 |
| ප්‍රස්තාරය 3.5 (b) | 2 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 26 |
| ප්‍රස්තාරය 3.6 (a) | 3 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 28 |
| ප්‍රස්තාරය 3.6 (b) | 3 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 28 |
| ප්‍රස්තාරය 3.7 (a) | 4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 30 |
| ප්‍රස්තාරය 3.7 (b) | 4 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 30 |
| ප්‍රස්තාරය 3.8 (a) | 5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 32 |
| ප්‍රස්තාරය 3.8 (b) | 5 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 32 |
| ප්‍රස්තාරය 3.9 (a) | 6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 34 |
| ප්‍රස්තාරය 3.9 (b) | 6 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 34 |
| ප්‍රස්තාරය 3.10 (a) | 7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 36 |
| ප්‍රස්තාරය 3.10 (b) | 7 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 36 |
| ප්‍රස්තාරය 3.11 (a) | 8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 39 |
| ප්‍රස්තාරය 3.11(b) | 8 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව | 39 |
| ප්‍රස්තාරය 3.12 | එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 40 |

# 1 සංස්කෘත විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 සංස්කෘත විෂය අධ්‍යයනයේ අරමුණු

01. භාෂාන්තර වර්ණමාලා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම
02. මාතෘභාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම
03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව, නක්ෂත්‍රශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත්‍ර, කලාශිල්ප හා දර්ශනවාද ඉගෙනීමේ දී ව්‍යවහාර භාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම
04. පෙරදිග භාෂා හා ශාස්ත්‍ර අධ්‍යයනයට අත්වැලක් සැපයීම
05. ඓතිහාසික මූලාශ්‍රය ගවේෂණය සඳහා උපකාරී වීම
06. භාෂාවන්හි වාග්විද්‍යාත්මක ව්‍යවහාරයන් පිළිබඳ මූලික දැනුම හා පාරිභාෂික ශබ්දමාලාවන්හි ව්‍යූහය හඳුනා ගැනීමට මූලාධාර වීම
07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම
08. හරධර්ම චරිතායනයට සහය වීම
09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම
10. විශ්වීය කේත (Universal Code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම
11. සංස්කෘත භාෂාවෙන් ලියවී ඇති මූලාශ්‍රය අධ්‍යයනයෙන්, අන්තර් ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම
12. ලෞකික සංස්කෘත සාහිත්‍යය හා තදනුබද්ධ සංස්කෘත සාහිත්‍යය අධ්‍යයනය කිරීමෙන් ජීවන පරමාර්ථ සාධනය සඳහා මනා රුකුලක් වීම
13. විෂයාන්තර දැනුම උද්ග්‍රහණයට මූලාධාර වීම
14. නව නිර්මාණකරණයට අවශ්‍ය අත්වැල සැපයීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### වගුව 1.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2240 | 19 | 2259 |
| ඉංග්‍රීසි | 16 | 0 | 16 |
| එකතුව | **2256** | **19** | **2275** |

### වගුව 1.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 182 | 8.07 | 2 | 10.53 | 184 | 8.09 |
| B | 182 | 8.07 | 0 | 0 | 182 | 8.00 |
| C | 582 | 25.79 | 7 | 36.85 | 589 | 25.89 |
| S | 792 | 35.11 | 5 | 26.31 | 797 | 35.03 |
| W | 518 | 22.96 | 5 | 26.31 | 523 | 22.99 |
| එකතුව | **2256** | **100.00** | **19** | **100.00** | **2275** | **100.00** |

## වගුව 1.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 152 | 14 | 9.21 | 13 | 8.55 | 36 | 23.68 | 58 | 38.16 | 121 | 79.61 | 31 | 20.39 |
| ගම්පහ | 188 | 21 | 11.17 | 15 | 7.98 | 47 | 25.00 | 71 | 37.77 | 154 | 81.91 | 34 | 18.09 |
| කළුතර | 173 | 14 | 8.09 | 16 | 9.25 | 43 | 24.86 | 54 | 31.21 | 127 | 73.41 | 46 | 26.59 |
| මහනුවර | 230 | 38 | 16.52 | 27 | 11.74 | 63 | 27.39 | 77 | 33.48 | 205 | 89.13 | 25 | 10.87 |
| මාතලේ | 81 | 4 | 4.94 | 12 | 14.81 | 29 | 35.80 | 25 | 30.86 | 70 | 86.42 | 11 | 13.58 |
| නුවරඑළිය | 34 | 1 | 2.94 | 5 | 14.71 | 19 | 55.88 | 7 | 20.59 | 32 | 94.12 | 2 | 5.88 |
| ගාල්ල | 168 | 12 | 7.14 | 12 | 7.14 | 37 | 22.02 | 58 | 34.52 | 119 | 70.83 | 49 | 29.17 |
| මාතර | 177 | 13 | 7.34 | 19 | 10.73 | 54 | 30.51 | 55 | 31.07 | 141 | 79.66 | 36 | 20.34 |
| හම්බන්තොට | 129 | 19 | 14.73 | 10 | 7.75 | 33 | 25.58 | 33 | 25.58 | 95 | 73.64 | 34 | 26.36 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 59 | 1 | 1.69 | 3 | 5.08 | 9 | 15.25 | 29 | 49.15 | 42 | 71.19 | 17 | 28.81 |
| ත්‍රිකුණාමලය | 12 | 1 | 8.33 | 0 | 0.00 | 3 | 25.00 | 5 | 41.67 | 9 | 75.00 | 3 | 25.00 |
| කුරුණෑගල | 210 | 14 | 6.67 | 8 | 3.81 | 42 | 20.00 | 77 | 36.67 | 141 | 67.14 | 69 | 32.86 |
| පුත්තලම | 46 | 3 | 6.52 | 0 | 0.00 | 8 | 17.39 | 25 | 54.35 | 36 | 78.26 | 10 | 21.74 |
| අනුරාධපුර | 142 | 7 | 4.93 | 15 | 10.56 | 34 | 23.94 | 46 | 32.39 | 102 | 71.83 | 40 | 28.17 |
| පොළොන්නරුව | 53 | 1 | 1.89 | 1 | 1.89 | 13 | 24.53 | 22 | 41.51 | 37 | 69.81 | 16 | 30.19 |
| බදුල්ල | 108 | 2 | 1.85 | 2 | 1.85 | 32 | 29.63 | 39 | 36.11 | 75 | 69.44 | 33 | 30.56 |
| මොණරාගල | 70 | 1 | 1.43 | 5 | 7.14 | 11 | 15.71 | 32 | 45.71 | 49 | 70.00 | 21 | 30.00 |
| රත්නපුර | 134 | 8 | 5.97 | 10 | 7.46 | 44 | 32.84 | 41 | 30.60 | 103 | 76.87 | 31 | 23.13 |
| කෑගල්ල | 108 | 10 | 9.26 | 9 | 8.33 | 32 | 29.63 | 42 | 38.89 | 93 | 86.11 | 15 | 13.89 |
| සමස්ත ප්‍රතිඵලය | 2,275 | 184 | 8.09 | 182 | 8.00 | 589 | 25.89 | 797 | 35.03 | 1,752 | 77.01 | 523 | 22.99 |

වගුව **1.4** ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 -100 | 7 | 0.31 | 2275 | 100.00 |
| 81 - 90 | 49 | 2.15 | 2268 | 99.69 |
| 71 - 80 | 114 | 5.01 | 2219 | 97.54 |
| 61 - 70 | 180 | 7.91 | 2105 | 92.53 |
| 51- 60 | 251 | 11.03 | 1925 | 84.62 |
| 41 - 50 | 389 | 17.10 | 1674 | 73.58 |
| 31 - 40 | 454 | 19.96 | 1285 | 56.48 |
| 21 - 30 | 491 | 21.58 | 831 | 36.53 |
| 11 - 20 | 316 | 13.89 | 340 | 14.95 |
| 01 - 10 | 23 | 1.01 | 24 | 1.05 |
| 00 - 00 | 1 | 0.04 | 1 | 0.04 |

ඉහත වගුව අධ්‍යයනයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදාහරණය -: 31 - 40 අතර පන්ති ප්‍රාන්තරය සලකා බලන විට මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2275 අතුරෙන් ලකුණු 31 - 40 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 454කි. එය ප්‍රතිශතයක් ලෙස 19.96%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 1285 වන අතර එය 56.48%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය : පැය 01 යි.

වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුය /Note :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40**ක් ලැබේ.
  Answer all question. This paper carries **40** marks.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
  In each of the question from 1 to 40 pick one of the alternatives (1),(2),(3),(4) which is correct or most appropriate.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✕) ලකුණු යොදන්න.
- Marks a cross (✕) on the number corresponding to your choice in the answer sheet provided.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.
- Further instrutions are given on the back of the answer sheet. Follow theme carefully.

1. සංස්කෘත භාෂාවේ අඝෝෂ අක්ෂර සංඛ්‍යාව ඇතුළත් වරණය කුමක් ද?
   What is the option that contains the number of *hard consonant* (*Aghoṣa*) letters?
   (1) නවයකි. Nine (2) දොළහකි. Twelve (3) දහතුනකි. Thirteen (4) විස්සකි. Twenty

2. සන්ධ්‍යක්ෂර පමණක් සඳහන් වරණය තෝරන්න.
   Select the option which contains only *Diphthongs (sandhyakṣara)* letters?
   (1) ए ओ अर् अल्। (2) ऐ औ आर् आल्। (3) ए ऐ ओ औ। (4) इ उ ऋ लृ।

3. මූර්ධජාක්ෂර පමණක් අයත් වරණය වන්නේ,
   The option that contains only the Cerebrals (*Mūrdhajākṣara)* is
   (1) ट ठ थ घ र। (2) ऋ ट ठ ड ण। (3) ऋ छ भ ठ ड। (4) ठ ढ ण द र।

4. नदीः - शाखया යන පදවල විභක්ති පිළිවෙළින් අයත් වරණය වන්නේ,
   The option that contains the cases of नदीः - शाखया in correct order is
   (1) द्वितीया-प्रथमा। (2) तृतीया-प्रथमा। (3) प्रथमा-चतुर्थी। (4) द्वितीया-तृतीया।

5. गृहपतीनाम् - मनुष्ये යන පදවල අර්ථය වන්නේ,
   The meanings of the words गृहपतीनाम् - मनुष्ये is
   (1) ගෙහිමියන්ගේ - මිනිසා කෙරෙහි
   of the house holders – on man
   (2) ගෙහිමියාගෙන් - මිනිසාට
   from house holder – To man
   (3) ගෙහිමියාගේ - මිනිසාගේ
   of the house holder - of the man
   (4) ගෙහිමියාට - මිනිසාගේ
   to house holder – of the man

6. मित्रेण किं व्यसनकाल पराङ्मुखेन । යටින් ඉරි ඇඳි පදයෙහි යෙදී ඇති කාරකය කුමක් ද?
   What is the *kāraka* of the underlined word in मित्रेण किं व्यसनकाल पराङ्मुखेन। ?
   (1) आधारकारक। (2) अपादानकारक। (3) करणकारक। (4) सम्प्रदानकारक।

7. पितृ ශබ්දයෙහි සප්තමී විභක්ති ඒකවචනය කුමක් ද?
   What is the locative singular of the stem पितृ ?
   (1) पित्रा। (2) पितुः। (3) पितरि। (4) पित्रे।

8. उपविश යන ආඛ්‍යාතපදය අයත් වන්නේ,
   The finite verb उपविश belongs to
   (1) लोट् परस्मैपद मध्यमपुरुष एकवचनम्। (2) लोट् परस्मैपद प्रथमपुरुष द्विवचनम्।
   (3) लट् परस्मैपद उत्तमपुरुष एकवचनम्। (4) लङ् परस्मैपद एकवचनम्।

9. गमिष्यति - अवदत् ආඛ්‍යාතයන්හි ලකාර පිළිවෙළින් අයත් වරණය තෝරන්න.
Select the option that contains the tenses (*lakāras*) of the verbs गमिष्यति - अवदत् in the order
(1) लट् - लङ्। (2) लोट् - लुङ्। (3) लृट् - लङ्। (4) लिट् - लृट्।

10. √चुर् - लङ् ලකාර පරස්මෛපද ප්‍රථමපුරුෂ ඒකවචන රූපය තෝරන්න.
Choose the past tense (लङ् *lakāra) parasmaipada* the first person singular form of √चुर्
(1) चोरयतु। (2) अचोरयत्। (3) अचोरयन्। (4) अचोरयाम।

11. ප්‍රේරණ (ආඥා, ප්‍රාර්ථනා) සූචක ලකාරය වන්නේ,
The tense (*lakāra*) indicative of the imperative mood
(1) लृट्। (2) विधिलिङ्। (3) लङ्। (4) लोट्।

12. कः + अपि। යන්නෙහි නිවැරදි සන්ධිය වන්නේ,
The correct *sandhi* form of कः + अपि। is
(1) कापि। (2) कोऽपि। (3) कौपि। (4) कोरपि।

13. तदाकर्ण्य යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,
The correct disjoint form of तदाकर्ण्य is
(1) तत् + आकर्ण्य। (2) तदा + कर्ण्य। (3) तद् + कर्ण्य। (4) तद + आकर्ण्य।

14. तथैव। යන සන්ධිපදය අයත් වන්නේ,
The *sandhi* word तथैव। belongs to
(1) विसर्गसन्धिः। (2) स्वरसन्धिः। (3) अनुस्वारसन्धिः। (4) व्यञ्जनसन्धिः।

15. ततस्तयोरेकतरोऽन्यं शृङ्गाभ्यां प्रहर्तुमारभत। මෙහි ඇතුළත් සන්ධිපද සංඛ්‍යාව තෝරන්න.
Select the number of *sandhi* words in ततस्तयोरेकतरोऽन्यं शृङ्गाभ्यां प्रहर्तुमारभत।
(1) තුනකි. Three (2) හතරකි. Four (3) පහකි. Five (4) හයකි. Six

16. ද්වන්ද්ව සමාසපදයක් වන්නේ,
A *dvandva* compound form is
(1) चक्रपाणिः। (2) देवलोकः। (3) मुखपद्मम्। (4) पाणिपादम्।

17. देवदत्तः යන්න කුමන සමාසයට අයත් වන්නේ ද?
To which kind of compound does the word देवदत्तः belong to ?
(1) द्विगुसमास। (2) कर्मधारयसमास। (3) तत्पुरुषसमास।। (4) द्वन्द्वसमास।

18. कवित्वम् යන්න කුමන තද්ධිතයට අයත් වන්නේ ද?
To which kind of derivative noun (*Taddita*) does the word कवित्वम् belong to?
(1) अतिशयार्थतद्धित। (2) अपत्यतद्धित। (3) अस्त्यर्थतद्धित। (4) भावतद्धित।

19. वैदिकः යන්නෙහි යෙදී ඇති තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?
What is the suffix used for the derivative noun वैदिकः ?
(1) अण्। (2) कण्। (3) इण्। (4) इकण्।

20. "कर्तव्यं <u>सुपरीक्षितम्</u>।" යටින් ඉරි ඇඳි පදය
The underlined word in "कर्तव्यं <u>सुपरीक्षितम्</u>।" is
(1) අතීතකාල කෘදන්තයකි. A past participle.
(2) වර්තමානකාල කෘදන්තයකි. A present participle.
(3) අනාගතකාල කෘදන්තයකි. A future participle.
(4) වර්තමානකාල කර්මකාරක කෘදන්තයකි. A present passive participle.

21. √पठ् ධාතුවෙන් තැනෙන තුමන්තක්‍රියා රූපය වන්නේ,
The infinitive (पूर्वक्रिया) formed from the root √पठ् is
(1) पठित्वा। (2) पठतु। (3) पठितुम्। (4) पठितम्।

22. दर्शनीय යන්නෙහි කෘදන්ත ප්‍රත්‍යය වෙන් වන්නේ,
The participle suffix of दर्शनीय is separated as
(1) दृश् + अनीय। (2) दर्श + नीय। (3) दृश् + य। (4) दृश् + ईय।

23. වර්තමාන කෘදන්ත පමණක් ඇති වරණය වන්නේ,
The option that contains only present participles is
(1) योज्यम् - दण्डनीयम्। (2) कथितवान्-करणीयम्।
(3) अभिहितम् - उक्तम्। (4) वर्धमान-गच्छन्।

24. सा कुत्र केन सार्धं गतेति निश्चयो नास्ति। අර්ථය වන්නේ,
The meaning of सा कुत्र केन सार्धं गतेति निश्चयो नास्ति। is
(1) ඇය කොහේ කවුරුන් සමග ගියේදැයි නිශ්චයක් නැත.
It is not clear where she went with whom.
(2) ඇය කොහේ ගියේදැයි නොදනිමි.
I don't know where she went.
(3) ඇය සමග කවුරුන් ගියේදැයි හැඟීමක් නැත.
I have no idea who went with her.
(4) ඇය කොහේ කවුරුන් සමග යන්නේදැයි නොදනිමි.
I don't know where she is going with whom.

25. "9.50ට බෙහෙත් බොන්න" යටින් ඉරි ඇඳි පදයෙහි අර්ථය වන්නේ,
The correct translation of the underlined phrase in " Take medicine at **9.50**" is
(1) दशोन नववादनम्। (2) दशाधिक नववादनम्।
(3) दशोन दशवादनम्। (4) सार्ध दशवादनम्।

26. "කවදාවත් එහෙම කරන්න එපා" නිවැරදි පරිවර්තනය වන්නේ,
The correct translation of " Never do like that" is
(1) कदापि तथा मा कुरु। (2) कदा एवं न करोतु।
(3) कदा हि तथैव कुरु। (4) कदापि यथा करोति तथा मा कुरु।

27. जननी नास्ति। मधुरान्नं न स्यात् යන වාක්‍යද්වය, සුදුසු පරිදි තනි වාක්‍යයක් ලෙස ලියනු ලබන්නේ,
The suitably combined form of the two sentences जननी नास्ति। मधुरान्नं न स्यात् is
(1) यदि जननी नास्ति यावत् मधुरान्नं न स्यात्।
(2) यथा जननी नास्ति तर्हि मधुरान्नं न स्यात्।
(3) यदा जननी नास्ति तदा मधुरान्नं न स्यात्।
(4) यद्यपि जननी नास्ति तावत् मधुरान्नं न स्यात्।

28. සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි පළමු සර්ගයෙහි අන්තර්ගතය වන්නේ,
The content of the first canto of *Saundarananda* epic is
(1) සුන්දරී විලාපය යි.
Sundari's lament.
(2) කපිලවස්තු පුරවැනුම යි.
Description of *kapilavastupura*.
(3) නන්දකුමරුගේ උත්පත්තිය යි.
The birth of prince Nanda.
(4) ස්ත්‍රීන්ගේ චපලගති යි.
Women's fickleness.

29. "कश्चित्" යන පදයෙන් ආරම්භ වන කාව්‍යය වන්නේ,
The poetry which commences with the word of "कश्चित्" is
(1) मेघदूतम्। (2) रघुवंशम्।
(3) कुमारसम्भवम्। (4) ऋतुसंहारम्।

30. මහාකවි කාලිදාසයන් විසින් රචනා කරන ලද ඛණ්ඩ කාව්‍ය ප්‍රමාණය
The number of lyric poetrics written by *Mahākavi Kālidasa* is
(1) දෙකකි. Two. (2) තුනකි. Three. (3) හතරකි. Four. (4) දහතුනකි. Thirteen.

31. දශකුමාරචරිතයෙහි ප්‍රධාන කථානායකයා වන්නේ,
The main hero of *Daśakumāracarita* is
(1) सोमदत्त। (2) दिलीप। (3) राजवाहन। (4) अपहारवर्मन्।

32. භදන්තාශ්වඝෝෂ මාහිමියන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙක
Two texts written by *Bhadantāśvaghoṣa* are ?
(1) सौन्दरनन्दमहाकाव्यम् - किरातार्जुनीयमहाकाव्यम्।
(2) ललितविस्तरः - ऋतुसंहारम्।
(3) सूत्रालंकारः - शिशुपालवधमहाकाव्यम्।
(4) शारीपुत्रप्रकरणम् - बुद्धचरितमहाकाव्यम्।

33. කුමාරසම්භව මහාකාව්‍යයෙහි ප්‍රධාන වස්තු විෂය වන්නේ
The main theme of *Kumārasambhava* epic is ?
(1) सुन्दरी - नन्द् प्रेमवृत्तान्तः। (2) शिव - पार्वती प्रेमवृत्तान्तः।
(3) राम - सीता प्रेमवृत्तान्तः। (4) नल - दमयन्ती प्रेमवृत्तान्तः

34. මහාකවි කාලිදාසයන්ට පසුව සිටි කවියෙකි.
A poet who was after *Mahākavi Kālidasa* is
(1) भारवी। (2) अश्वघोष। (3) भास। (4) वाल्मीकि।

35. पद्यचिन्तामणि යනු
पद्यचिन्तामणि is
(1) दृश्यकाव्यम्।। (2) महाकव्यम्। (3) खण्डकाव्यम्। (4) शतककाव्यम्।

36. "विग्रह" අයත් වන්නේ කුමන ග්‍රන්ථයට ද?
To which text does – the "विग्रह" belong to
(1) पञ्चतन्त्रम्।। (2) सुहृद्भेदः। (3) मित्रभेदः। (4) हितोपदेशः।

37. ජානකීහරණ මහාකාව්‍යයෙහි සර්ග සංඛ්‍යාව වන්නේ,
The number of cantoes in *Jānakīharaṇa Mahākāvya* is
(1) 13කි. Thirteen (2) 17කි. Seventeen (3) 19කි. Nineteen (4) 20කි. Twenty

38. සංජීවක යනු
Saṁjīvaka is
(1) සිංහයෙකි. A lion. (2) නරියෙකි. A fox. (3) වෘෂභයෙකි. A bull. (4) පක්ෂියෙකි. A bird.

39. ඍතුසංහාරයෙහි වර්ණනා කරන ලද ඍතු සංඛ්‍යාව කීය ද?
The number of seasons described in *Ṛtusaṁhāra* is
(1) දෙකකි. Two (2) තුනකි. Three (3) හතරකි. Four (4) හයකි. Six

40. දණ්ඩින් විසින් රචනා කරන ලද ගද්‍යකාව්‍යය වන්නේ,
The prose which was written by Daṇḍin is ?
(1) काव्यादर्शः। (2) दशकुमारचरितम्। (3) हर्षचरितम्। (4) कादम्बरी।

වගුව **2.1** I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 21. | 3 |
| 02. | 3 | 22. | 1 |
| 03. | 2 | 23. | 4 |
| 04. | 4 | 24. | 1 |
| 05. | 1 | 25. | 3 |
| 06. | 3 | 26. | 1 |
| 07. | 3 | 27. | 3 |
| 08. | 1 | 28. | 2 |
| 09. | 3 | 29. | 1 |
| 10. | 2 | 30. | 1 |
| 11. | 4 | 31. | 3 |
| 12. | 2 | 32. | 4 |
| 13. | 1 | 33. | 2 |
| 14. | 2 | 34. | 1 |
| 15. | 2 | 35. | 2 |
| 16. | 4 | 36. | 4 |
| 17. | 3 | 37. | 4 |
| 18. | 4 | 38. | 3 |
| 19. | 4 | 39. | 4 |
| 20. | 1 | 40. | 2 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණ




ප්‍රස්තාරය 2.1; (RD/16/5/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)
ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති දෙවන ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.86කි.
එනම් දෙවන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 86%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව දෙවන ප්‍රශ්නයේ පහසුතාව 86%ක් ලෙස දැක්විය හැකිය.

## වගුව 2.2 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 3 | 4.80 | 21.75 | 57.90 | 15.02 | 0.52 |
| 2 | 3 | 3.23 | 6.38 | 86.38 | 4.02 | 0.00 |
| 3 | 2 | 11.53 | 65.50 | 12.14 | 10.57 | 0.26 |
| 4 | 4 | 9.61 | 11.09 | 58.17 | 20.61 | 0.52 |
| 5 | 1 | 46.46 | 23.84 | 16.51 | 12.93 | 0.26 |
| 6 | 3 | 19.56 | 17.90 | 43.49 | 18.60 | 0.44 |
| 7 | 3 | 10.74 | 17.64 | 39.39 | 32.23 | 0.00 |
| 8 | 1 | 37.55 | 21.14 | 36.44 | 20.00 | 0.87 |
| 9 | 3 | 22.62 | 16.77 | 47.34 | 13.01 | 0.26 |
| 10 | 2 | 20.17 | 59.83 | 12.05 | 7.77 | 0.17 |
| 11 | 4 | 11.53 | 36.86 | 11.97 | 38.86 | 0.79 |
| 12 | 2 | 21.75 | 65.76 | 8.82 | 3.58 | 0.09 |
| 13 | 1 | 50.66 | 13.19 | 10.92 | 25.07 | 0.17 |
| 14 | 2 | 13.54 | 57.21 | 11.62 | 17.38 | 0.26 |
| 15 | 2 | 40.09 | 35.28 | 17.47 | 6.99 | 0.17 |
| 16 | 4 | 12.05 | 31.88 | 21.40 | 33.97 | 0.70 |
| 17 | 3 | 9.69 | 29.69 | 45.59 | 14.67 | 0.35 |
| 18 | 4 | 18.86 | 20.79 | 23.84 | 36.07 | 0.44 |
| 19 | 4 | 17.64 | 14.50 | 27.07 | 40.61 | 0.17 |
| 20 | 1 | 23.14 | 30.22 | 21.92 | 24.37 | 0.35 |
| 21 | 3 | 14.06 | 30.11 | 48.73 | 6.20 | 0.9 |
| 22 | 1 | 28.65 | 33.19 | 8.56 | 29.34 | 0.26 |
| 23 | 4 | 23.84 | 17.21 | 26.64 | 31.79 | 0.52 |
| 24 | 1 | 72.23 | 6.46 | 8.47 | 12.58 | 0.26 |
| 25 | 3 | 22.79 | 31.62 | 30.22 | 14.93 | 0.44 |
| 26 | 1 | 47.42 | 29.96 | 9.34 | 13.19 | 0.09 |
| 27 | 3 | 21.05 | 21.57 | 43.76 | 13.19 | 0.44 |
| 28 | 2 | 17.99 | 51.00 | 25.41 | 5.50 | 0.09 |
| 29 | 1 | 34.06 | 23.93 | 31.00 | 10.39 | 0.61 |
| 30 | 1 | 43.67 | 25.33 | 18.25 | 12.31 | 0.44 |
| 31 | 3 | 17.03 | 32.49 | 36.94 | 13.10 | 0.44 |
| 32 | 4 | 22.71 | 11.97 | 8.56 | 56.42 | 0.35 |
| 33 | 2 | 15.46 | 47.69 | 21.57 | 14.67 | 0.61 |
| 34 | 1 | 38.52 | 22.79 | 14.93 | 13.32 | 0.44 |
| 35 | 2 | 19.04 | 28.12 | 33.80 | 18.78 | 0.26 |
| 36 | 4 | 23.58 | 16.33 | 14.76 | 45.07 | 0.26 |
| 37 | 4 | 24.28 | 26.46 | 23.58 | 25.41 | 0.26 |
| 38 | 3 | 24.60 | 15.46 | 45.94 | 10.57 | 0.44 |
| 39 | 4 | 7.25 | 30.66 | 31.44 | 29.78 | 0.87 |
| 40 | 2 | 29.17 | 49.78 | 6.81 | 13.80 | 0.44 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

"Missing" තීරයේ දක්වා ඇත්තේ කිසිදු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් හෝ අපේක්ෂක ප්‍රතිශතයයි.

**වගුව 2.3 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය**

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා / විෂය ක්ෂේත්‍ර 09කි. ඒ ඒ තේමා විෂය ක්ෂේත්‍ර අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේ ය.

| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| වර්ණමාලාව | 1 , 2, 3 |
| නාම වරනැගීම | 4, 5, 6, 7 |
| ආඛ්‍යාත වරනැගීම | 8, 9, 10, 11 |
| සන්ධි | 12, 13, 14, 15 |
| සමාස | 16, 17 |
| තද්ධිත | 18, 19 |
| කෘදන්ත | 20, 21, 22, 23 |
| වාක්‍යනිර්මාණ | 24, 25, 26, 27 |
| සාහිත්‍යය | 28, 29, 30, 31, 32, 33, 34, 35, 36 37, 38, 39, 40 |

I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විතය.

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා/විෂය ක්ෂේත්‍ර සංඛ්‍යාව 09කි. එම තේමා/ විෂය ක්ෂේත්‍ර 09 අතුරෙන් වැඩි ම ප්‍රශ්න සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත්තේ සාහිත්‍යය තේමාව/ විෂය ක්ෂේත්‍රය යටතේ වන අතර ඉදිරිපත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 13කි. නාම වරනැගීම, ආඛ්‍යාත වරනැගීම, සන්ධි, කෘදන්ත හා වාක්‍ය නිර්මාණ සඳහා ප්‍රශ්න 04 බැගින් ඉදිරිපත් කර තිබේ. වර්ණමාලාව සඳහා ප්‍රශ්න 03 ක් ද, සමාස හා තද්ධිත සඳහා ප්‍රශ්න 02 බැගින් ද ඉදිරිපත් කර තිබේ.




ප්‍රස්තාරය 2.2

I පත්‍රයෙහි ප්‍රශ්න 40 අතුරෙන් 2 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 0.86කි. එය සමස්ත I පත්‍රයෙහිම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන අතර එය වර්ණමාලාව තේමාව යටතේ විමසන ලද ප්‍රශ්නයකි. සමස්ත I පත්‍රයෙහි අඩුම පහසුතා දර්ශකය 0.21කි. එය නාමවර නැගීම තේමාව යටතේ ඉදිරිපත්ව ඇති 4 වන ප්‍රශ්නයයි. I පත්‍රයෙහි සාහිත්‍ය තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්න 13 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 0.56කි. මෙම තේමාව යටතේ 50% ක් හෝ ඊට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න 03කි. ඒවා නම් 28 ,32 හා 40 ප්‍රශ්නයි. අඩුම පහසුතාව සහිත 37 ප්‍රශ්නයෙහි




ප්‍රස්තාරය 2.3

සංස්කෘත I පත්‍රය සැකසීමේ දී පදනම් කරගත් තේමා 9 අතුරෙන් එක් එක් තේමාව/ විෂය ක්ෂේත්‍රය යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රතිශතය හා එක් එක් ප්‍රශ්නයේ පහසුතාව මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ඉහත ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇත්තේ **සාහිත්‍ය තේමාව** යටතේ වන අතර එම තේමාවෙහි මධ්‍යක පහසුතාව 41%කි. වර්ණමාලාව තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න ප්‍රතිශතය 8%ක් වන අතර එහි මධ්‍යක පහසුතාව 70%කි.

## වගුව 2.4 තේමා අනුව පහසුතාව වැඩිම හා අඩුම ප්‍රශ්න අංකය එහි පහසුතාව හා තේමාවට අදාළ ප්‍රශ්නවල සමස්ත පහසුතාව

| තේමාව /විෂය ක්ෂේත්‍රය | පහසුතාව වැඩි ම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්නය හා එහි පහසුතාව | ප්‍රශ්නවල සමස්ත පහසුතාව |
|---|---|---|---|
| වර්ණමාලාව | 2(86%) | 1(58%) | 70% |
| නාම වරනැගීම | 5(46%) | 4(21%) | 37% |
| ආඛ්‍යාත වරනැගීම | 10(60%) | 8 (38%) | 46% |
| සන්ධි | 12(66%) | 15(35%) | 52% |
| සමාස | 17(46%) | 16(34%) | 40% |
| තද්ධිත | 19(41%) | 18(36%) | 38% |
| කෘදන්ත | 21(49%) | 20(23%) | 33% |
| වාක්‍යනිර්මාණ | 24(72%) | 25(30%) | 48% |
| සාහිත්‍යය | 32(56%) | 37(25%) | 41% |

## 2.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2021 වර්ෂයේ සංස්කෘත විෂයයෙහි I පත්‍රය සැකසීමේ දී සාහිත්‍ය තේමාවට අදාළ ව ප්‍රශ්න 13ක් ද, නාම වරනැගීම, ආඛ්‍යාත වරනැගීම, සන්ධි, කෘදන්ත හා වාක්‍යනිර්මාණය යන තේමාවන්ට අදාළ ව ප්‍රශ්න 04 බැගින් ද ඉදිරිපත් කර ඇත.

වර්ණමාලාව නම් ඒකකයට (නිපුණතාවට) අනුව සකස් වී ඇති 1, 2 හා 3 යන ප්‍රශ්න අතුරෙන් දෙවන ප්‍රශ්නය සඳහා පහසුතාව 86%කි. දෙවන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 86%ක ප්‍රමාණයකි. 1,2 හා 3 යන ප්‍රශ්නවල සමස්ත පහසුතාව 70%කි. I පත්‍රයේ ප්‍රශ්න 40 අතුරෙන් ඉහළම පහසුතාව වන්නේ ද දෙවන ප්‍රශ්නයට හිමි 86% යි. ගුණ වෘද්ධි ආදි මූලික සංඥා නාම හා අක්ෂරෝත්පත්තිස්ථාන හඳුනා ගැනීම හා අවබෝධ කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රමුඛතාව ලබා දිය යුතු වේ.

නාම වරනැගීම විෂය ක්ෂේත්‍රයට අදාළ 4, 5, 6 හා 7 යන ප්‍රශ්න අතුරෙන් වැඩි ම පහසුතාව සහිත පස්වන ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි. අඩු ම පහසුතාව සහිත හතරවන ප්‍රශ්නයෙහි පහසුතාව 21%කි. හතරවන ප්‍රශ්නයට පිළිතුර ලෙස 58%ක බහුතර අපේක්ෂකයන් තෝරාගෙන ඇත්තේ තුන්වන වරණයයි. අපේක්ෂකයා තුන්වන වරණය තෝරා ගැනීමට හේතු වී ඇත්තේ නාම වරනැගීමෙහි ලිංගභේදය හා අර්ථය පිළිබඳ අවබෝධය අවම වීම නිසා විය හැකිය. නාම වරනැගීමේ දී ලිංගභේදය හා විභක්ති අර්ථ පිළිබඳ දැනුම ලබා දීමට ප්‍රමුඛතාවක් ලබා දිය යුතුයැයි යෝජනා කෙරේ.

ආඛ්‍යාත වරනැගීම විෂය ක්ෂේත්‍රයට අදාළ 8 , 9, 10 හා 11 ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය දහවන ප්‍රශ්නයෙහි පහසුතාව 60%කි. පහසුතාව අවම අටවන ප්‍රශ්නයයි. එහි පහසුතාව 38%කි. ප්‍රශ්න 04හි සමස්ත පහසුතාව 40%කි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොත නිසිලෙස පරිහරණය කිරීමත් ආඛ්‍යාත වරනැගීම හා ඒවායෙහි අර්ථ පිළිබඳ අවබෝධය ලබා දීමත් සුදුසු වේ.

සන්ධි විෂය ක්ෂේත්‍රයට අදාළ 12, 13, 14 හා 15 ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම දොළොස්වන ප්‍රශ්නයෙහි පහසුතාව 66%කි. පහසුතාව අඩුම පහළොස්වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 35%කි. ප්‍රශ්න 04හි සමස්ත පහසුතාව 52%කි. පහළොස්වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 40%ක ප්‍රතිශතයක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ පළමුවන වරණයයි. සංස්කෘත භාෂාවෙන් දක්වා ඇති සන්ධි පදයක මූලික අංග නිවැරදි ව විශ්ලේෂණය කර ගැනීමේ දුර්වලතාවක් මෙහිදී පෙන්නුම් කර ඇත. සන්ධි ප්‍රභේදයන් හඳුනාගැනීමට ඇති මූලික ලක්ෂණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමට යෝජනා කෙරේ.

සමාස විෂය ක්ෂේත්‍රයට අදාළ 16, 17 ප්‍රශ්න අතුරෙන් දහසය වන ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි. එය එම විෂය ක්ෂේත්‍රයට අදාළ පහසුතාව වැඩිම ප්‍රශ්නයයි. දහසය වන ප්‍රශ්නයෙහි පහසුතාව 34%කි. මෙම ප්‍රශ්නයට පිළිතුර ලෙස අපේක්ෂකයන් 31%ක් තෝරා ගෙන ඇත්තේ දෙවන වරණයයි. මෙමගින් පෙන්නුම් කරන්නේ සමාස පිළිබඳ මූලික අවබෝධයක් අපේක්ෂකයන්ට නොමැති බවයි. සමාසවල මූලික ප්‍රභේද පිළිබඳ අවබෝධය ලබා දීමට යෝජනා කෙරේ. ඒ සඳහා සරල, ප්‍රායෝගික උදාහරණ මෙන් ම පෙළපොත, නිර්දිෂ්ට ග්‍රන්ථ භාවිත කිරීම සිදු කළ යුතු ය.

තද්ධිත විෂය ක්ෂේත්‍රයට අදාළ 18, 19 ප්‍රශ්න අතුරෙන් දහනව වන ප්‍රශ්නය සඳහා 41%ක් ද දහඅට වන ප්‍රශ්නය සඳහා 36%ක් ද වශයෙන් ප්‍රශ්න දෙකෙහිම පහසුතාව අඩු මට්ටමක පවතී. මෙහි දී තද්ධිත ප්‍රභේද හා ප්‍රත්‍යයන්හි අර්ථ පිළිබඳ නිසි අවබෝධයක් බහුතරයක් අපේක්ෂකයන් තුළ නොමැති බව පෙනේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තද්ධිත ප්‍රභේද සහ ප්‍රත්‍යය පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

කෘදන්ත විෂය ක්ෂේත්‍රයට අදාළ 20, 21, 22 හා 23 යන ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම විසිඑක් වන ප්‍රශ්නයෙහි පහසුතාව 49%කි. පහසුතාව අවම විසිවන ප්‍රශ්නයෙහි පහසුතාව 23%කි. මෙහිදී අපේක්ෂකයන් වැඩි පිරිසක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ හතරවන වරණයයි. එය ප්‍රතිශතයක් ලෙස 24%කි. කෘදන්ත ව්‍යාකරණ ලෙස ඉගෙනුම් ක්‍රියාවලියේ දී යොදා ගෙන තිබුණ ද ප්‍රායෝගික භාවිතයේ දී කෘදන්ත පද හඳුනාගැනීමේ දුර්වලතාවක් පෙන්නුම් කරයි. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගැනෙන ව්‍යාකරණ ප්‍රායෝගික භාවිතය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

වාක්‍ය නිර්මාණය විෂය ක්ෂේත්‍රයට අදාළ 24, 25, 26 හා 27 යන ප්‍රශ්න අතුරෙන් විසිහතර වන ප්‍රශ්නයෙහි පහසුතාව 72%කි. විසිපස් වන ප්‍රශ්නය අඩු ම පහසුතාවක් සහිත ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 30%කි. විසිපස් වන ප්‍රශ්නයට පිළිතුර ලෙස අපේක්ෂකයන් 32%ක් තෝරාගෙන ඇත්තේ දෙවන වරණය යි. මේ සඳහා සංස්කෘත දේවනාගරී පෙළ කියවීමේ දුර්වලතාව, වාක්‍ය, පද විශ්ලේෂණය කර ගැනීමේ අපහසුතාව හා පර්යාය පද පිළිබඳ අවබෝධය අඩුවීම බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාඨග්‍රන්ථ කියවීමේ දී නාගරී අක්ෂරයන් මගින් සංයුක්තාක්ෂර භාවිතයට හුරු කරවීම, වාක්‍යයක පද බෙදා දැක්වීමට ශිෂ්‍යයා උනන්දු කරවීම, පර්යාය පද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ශිෂ්‍යයා යොමු කරවීමට කටයුතු කළ යුතු ය.

සාහිත්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, 37, 38, 39 හා 40 යන ප්‍රශ්න අතුරෙන් තිස්දෙවන ප්‍රශ්නයෙහි පහසුතාව 56%කි. අවම පහසුතාවක් සහිත තිස්හත්වන ප්‍රශ්නයෙහි පහසුතාව 25%කි. අපේක්ෂකයන්ගෙන් 26%ක් එම ප්‍රශ්නයට පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ දෙවන වරණය යි. බහුතරයක් අපේක්ෂකයන් මෙම පිළිතුර තෝරා ගැනීමට හේතු වී ඇත්තේ ප්‍රශ්නය පිළිබඳ නිසි අවබෝධයකින් තොර ව පිළිතුර ලකුණු කිරීම නිසා බව පෙන්වා දිය හැකි ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී 4-5 ශ්‍රේණිවල පෙළපොත්හි දැක්වෙන සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ කොටස් අවබෝධයෙන් යුතු ව හැදෑරීමටත්, ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී සාවධාන ව පිළිතුරු සැපයීමටත්, අපේක්ෂකයන් පුහුණු කළ යුතු බවට යෝජනා කෙරේ.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II** පත්‍රය - කාලය **:** පැය 03යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

**I** කොටස - අනිවාර්ය ප්‍රශ්න දෙකකින් සමන්විත ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **12** බැගින් ලකුණු **24**කි.

**II** කොටස - ප්‍රශ්න හයකින් සමන්විත ය. ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **12** බැගින් ලකුණු **36**කි.

**II** පත්‍රය සඳහා මුළු ලකුණු = **24 + 36 = 60**

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම **:** | **I** පත්‍රය | = | **40** |
| | **II** පත්‍රය | = | **60** |
| | අවසාන ලකුණ | = | **100** |

## 3.2 II වන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා ඇත.

උදා :- 1 හා 2 යන ප්‍රශ්න අනිවාර්යය වුවත් දෙවන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 98%ක පමණ පිරිසකි. සෙසු ප්‍රශ්න අතුරෙන් අපේක්‍ෂකයන් වැඩි පිරිසක් පිළිතුරු සැපයීම සඳහා තෙවන ප්‍රශ්නය තෝරාගෙන ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 70%ක් පමණ වේ. අටවන ප්‍රශ්නය තෝරාගත් පිරිස 20%ක් පමණ වේ. එය අඩුම අපේක්‍ෂකයන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය වේ.

ප්‍රස්තාරය 3.1 ( RD/16/2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි)

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා-: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 12කි. අපේක්ෂකයන් 54%ක පිරිසක් ලකුණු 0-3 අතර ලබාගෙන ඇත. අපේක්ෂකයන් 18%ක පිරිසක් ලකුණු 4- 6 අතර ද ලකුණු 7-9 අතර 16%ක් ද අපේක්ෂකයන් 12%ක් පමණ ලකුණු 10- 12 අතර ද ලබාගෙන ඇත.

ප්‍රස්තාරය 3.2 ( RD/16/2/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි)

## 3.4 II වන ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 3.3: (RD/16/4/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

උදා:- අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 7 (ii) (b) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.61කි. එනම් 7 (ii) (b) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 61%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම අනුකොටසෙහි පහසුතාව 61%කි. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 8 (ii) c කොටසෙහි පහසුතා දර්ශකය 0.13කි. එනම් 8 (ii) c කොටස සඳහා අපේක්ෂකයන් 13%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 13%කි.

## 3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

### 01 ප්‍රශ්නය

01. (i) පහත සඳහන් ගද්‍යපාඨ සිංහලයට නගන්න. (ලකුණු 06 යි)
Translate the following prose quotations into English. (06 marks)

१. एवं कृते द्वयोरपि विनाशो भविष्यति ।
එසේ කළ කල්හි දෙදෙනාගේ ම විනාශය වන්නේ ය.

२. किं कदाचित्पक्षिपुरीषे सुवर्णं संभवति ।
කිම ? කිසිකලෙක පක්ෂි අසූචිවල ( වසුරුවල) රත්තරන් හටගනියි ද?

३. ब्राह्मण ! जलार्थमहं तडागे यास्यामि ।
බමුණ, මම දිය ( ගෙනෙනු) පිණිස පොකුණට යන්නෙමි.

(ii) පහත සඳහන් පද්‍යපාඨ සිංහලයට නගන්න. (ලකුණු 06 යි)
Translate the following verse quotations into English. (06 marks)

१. जननी जन्मभूमिश्च स्वर्गादपि गरीयसि ।
මව ද උපන්බිම ද ස්වර්ගයටත් වඩා අගනේ ය.

२. चकर्त वक्त्रं विचकर्ष वस्त्रम् ।
මුහුණ සූරාගත්තා ය. ඇඳුම ඉරා ගත්තා ය.

३. चक्रवत् परिवर्तन्ते दुःखानि च सुखानि च ।
දුක සැප දෙක චක්‍රයක් මෙන් කැරකේ. / පෙරළේ.

### 01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.4 (a)

පළමු ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි.
අංක 3.12 ප්‍රස්තාරය අනුව අපේක්ෂකයන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී 27%ක පහසුතාවක් දක්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 54%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 18%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 16%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 12%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ට වඩා ලබා ගත් පිරිස 12%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 54%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.4 (b)

- මෙම ප්‍රශ්නයෙහි කොටස් දෙකකි. එහි පළමු කොටස නිර්දිෂ්ට ගද්‍යපාඨ ඇසුරෙන් ලබා දී ඇති අතර, දෙවන කොටස නිර්දිෂ්ට පද්‍යපාඨ ඇසුරෙන් ලබා දී ඇත. පළමු කොටස සඳහා පහසුතාව 31%කි. දෙවන කොටස සඳහා පහසුතාව 23%කි.

- නිර්දිෂ්ට ගද්‍යපද්‍ය පාඨවල අර්ථ පාඩම් ගැනීම මෙන්ම ගද්‍යපද්‍ය පාඨයන්හි වාක්‍ය ඛණ්ඩ ඔස්සේ පරිවර්තන අභ්‍යාස සඳහා සිසුන් හුරු කිරීමට යෝජනා කෙරේ.

**02** ප්‍රශ්නය

02. (i) विद्या हीना न शोभन्ते निर्गन्धा इव किंशुकाः।

මේ ප්‍රකාශයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

Explain the significance of this statement. *(04 marks)*

නුගතා සුවඳ නැති කැලෑමලක් මෙන් ශෝභමාන නොවේ.

(ii) නිර්දිෂ්ටපාඨ ග්‍රන්ථාගත ගද්‍ය හා පද්‍ය ප්‍රකාශ ආශ්‍රයෙන් පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් පිළිබඳ විවරණයක් කරන්න. *(ලකුණු 08 යි)*

Make a review on **either of** following topics based on prescribed verse and prose statements. *(08 marks)*

(අ) අපරීක්ෂාකාරීව කටයුතු කිරීම පශ්චාත්තාපයට හේතු වේ. (*බ්‍රාහ්මණීනකුල කථාව* ආශ්‍රයෙන්)

(a) Acting carelessly leads to remorse. (based on *Brāhmaṇinakula kathā* )

(ආ) සීමාරහිත ඇලීම පරිහානියට දොරටුවකි. (*කථාප්‍රියස්‍ය මහීපාලස්‍ය කථාව* ආශ්‍රයෙන්)

(b) Unlimited attachment is a door to decline. (based on *kathāpriyasya mahīpālasya kathā*)

නියමිත ඉඩ නිසි පරිදි ප්‍රයෝජනයට ගෙන තිබීම. මාතෘකාවට අදාළව ම පිළිතුරු ලියා තිබීම. ප්‍රධාන මාතෘකාවට අදාළ නිර්දිෂ්ට කතාව ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම. කෙරෙහි අවධානය යොමු කර ලකුණු ප්‍රදානය කරන ලදී.

## 02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3.5 (a)

දෙවන ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි. අංක 3.12 ප්‍රස්තාරය අනුව අපේක්ෂකයන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී 41%ක පහසුතාවක් දක්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 36%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 18%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 27%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 19%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10 - 12 අතර ලබාගත් පිරිස 19%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 36%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.5 (b)

- මෙහි දෙවෙනි කොටසෙහි අනුකොටස් දෙකකි. 02 (ii) (a) අනුකොටස සඳහා පහසුතාව 43%ක් ද, 02 (ii) (b) අනුකොටස සඳහා පහසුතාව 41%ක් ද වේ. මෙම ප්‍රශ්නයෙහි 02 (i) කොටස සඳහා පහසුතාව 39%කි.

- මෙම ප්‍රශ්නයෙහි (ii) (a) අනුකොටසට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් තුළ පෙළපොතෙහි සඳහන් මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත අධ්‍යයනය සඳහා අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උද්ධෘත පාඨ ආශ්‍රයෙන් නිර්මාණාත්මක වැකි කිහිපයක් ලිවීමට හුරු කිරීම සුදුසු බවට යෝජනා කෙරේ.

- ගද්‍යපාඨ පරිවර්තනයට පෙර මාතෘභාෂාවෙන් කතාව කියා දී ශිෂ්‍යයාට එම කතාව මතකයෙන් ලිවීම, කීම හා චිත්‍ර ආශ්‍රයෙන් ඇඳ දැක්වීම ආදි ශිෂ්‍ය ක්‍රියාකාරකම්වල යෙදවීමට යෝජනා කෙරේ.

**03** ප්‍රශ්නය

03. (i) उ කාරයෙහි වෘද්ධි අක්ෂරය කුමක් ද? (ලකුණු 02 යි)

What is the *vrddhi* form of उ is ? *(02 marks )*

औ

(ii) පහත සඳහන් සාරස්වත සූත්‍රවල තේරුම ලියන්න. (ලකුණු 04 යි)

Write the meaning of the following *Sārasvata sūtrās*. *(04 marks)*

१. ऐ आय्। : ස්වරයා පරකල්හි "ඓ " කාරයට "ආය් " ආදේශ වේ.

२. आरै औ वृद्धिः। : ආ, ඓ, ඖ, ආර්, ආල් යන මේවා වෘද්ධි නම් වේ.

३. वर्णादर्शनं लोपः। : අකුරු නොපෙනී යෑම හෙවත් ඉවත්වීම ලෝප නම් වේ.

४. एदैतोः कण्ठतालु। : එ සහ ඓ යන අක්ෂර කණ්ඨතාලුජ නම් වේ.

(iii) පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න. (ලකුණු 03 යි)

Disjoin the following *sandhi* forms. *(03 marks)*

१. तस्माच्च। : तस्मात् + च

२. विद्यालय। : विद्या + आलय

३. पुनर्मिलामः। : पुनः + मिलामः

(iv) धन्योऽसि / तच्छतेन / एकोदराः යන සන්ධිපද සුදුසු පරිදි වගුගත කරන්න. (ලකුණු 03 යි)

Complete the following table with the appropriate *sandhi* forms धन्योऽसि / तच्छतेन / एकोदराः

*(03 marks)*

| स्वरसन्धि | व्यञ्जनसन्धि | विसर्गसन्धि |
|---|---|---|
| एकोदराः | तच्छतेन | धन्योऽसि |

## 03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.6 (a)

අංක 3.12 ප්‍රස්තාරය අනුව තුන්වන ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 36%කි.

ලකුණු ලබා ගැනීමේ දී,

| | | |
|---|---|---|
| 0 - 3 | ප්‍රාන්තරයේ | 43%ක් ද, |
| 4 - 6 | ප්‍රාන්තරයේ | 32%ක් ද, |
| 7 - 9 | ප්‍රාන්තරයේ | 18%ක් ද, |
| 10 - 12 | ප්‍රාන්තරයේ | 7%ක් ද, |

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 7%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 43%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.6 (b)

- සාරස්වත සූත්‍ර හා සන්ධි ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි. මෙහි කොටස් 04කි. 03 (i) කොටස සඳහා පහසුතාව 46%ක් ද, 03 (ii) කොටස සඳහා පහසුතාව 29%ක් ද, 03 (iii) කොටස සඳහා පහසුතාව 21%ක් ද, 03 (iv) කොටස සඳහා පහසුතාව 47%ක් ද වේ.

- 4 සහ 5 පෙළපොත්වලට අදාළ මූලික සාරස්වත සූත්‍ර අර්ථ සහිත ව වාචෝද්ගත කිරීමට යෝජනා කෙරේ.

- ප්‍රායෝගික පොත්පත්වල භාවිත වන සන්ධිපද හඳුනා ගැනීමට හා ඒවා විසන්ධි කිරීමට අවශ්‍ය පුහුණු ක්‍රියාකාරකම් සිදු කිරීමට යෝජනා කෙරේ.

**04** ප්‍රශ්නය

(i) **विना** යන්න යෙදෙන්නේ **තෘතීයා** / **පඤ්චමී** විභක්තිය සමගයි. *(ලකුණු 02 යි)*

(ii) පහත සඳහන් පදවල **විභක්තිය** හා වචනය ලියන්න. *(ලකුණු 04 යි)*
Write the case and the number of the following words. *(04 marks)*

| පදය | විභක්තිය | වචනය |
|---|---|---|
| मयि | සප්තමී | ඒකවචනය |
| मातॄः | ද්විතීයා | බහුවචනය |
| धेनवः | ප්‍රථමා | ඒකවචනය |
| शालायाम् | සප්තමී | ඒකවචනය |

(iii) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා, **හිස්තැනට** ගැළපෙන වචනය ලියන්න. *(ලකුණු 06 යි)*
Look at the word pattern of the given example and fill in the blanks with the appropriate words accordingly. *(06 marks)*

| लत | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| ***प्रथमा*** | ***बालकः*** | ***बालकौ*** | ***बालकाः*** |
| प्रथमा | का / किम् | के | काः / कानि |
| द्वितीया | तम् | तौ | तान् |
| तृतीया | अहिना | अहिभ्याम् | अहिभिः |
| सप्तमी | पितरि | पित्रोः | पितृषु |

## 04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.7 (a)

අංක 3.12 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 31%කි.

ලකුණු ලබා ගැනීමේ දී,
0 - 3 ප්‍රාන්තරයේ 41%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 38%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 17%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 3%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 3%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 41%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.7 (b)

- මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතුරෙන් පහසුතාව වැඩි 04 (i) කොටසෙහි පහසුතාව 38%කි. එසේ ම පහසුතාව අඩුම 04(iii) කොටසෙහි පහසුතාව 23%කි.

- 5 ශ්‍රේණියට අදාළ පෙළපොතෙහි සඳහන් විභක්ති ප්‍රයෝග පිළිබඳ අවබෝධය ලබාදීමට යෝජනා කෙරේ.

- 4 ශ්‍රේණියට අදාළ පෙළපොතෙහි සඳහන් නාම වරනැගීමේ විශේෂතා අධ්‍යයනයට පුහුණු අභ්‍යාස හා ක්‍රියාකාරකම් සිදු කිරීමට යෝජනා කෙරේ.

## 05 ප්‍රශ්නය

(i) උදාහරණය ආශ්‍රයෙන් සුදුසු පරිදි වගු සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*
In accordance with the given example, complete the following table. *(02 marks)*

| *උදා - eg.* **लट्** | *වර්තමානෙ / **Present*** |
|---|---|
| लिट् | නොදුටු අතීත කාලය (පරෝක්ෂාර්ථය) |
| लुङ् | අනද්‍යතනාතීත (අදින් පෙර අතීත කාලය) |

(ii) සුදුසු කෘදන්ත රූපවලින් වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 04 යි)*
Complete the following table with appropriate *kṛdantās*. *(04 marks)*

| √ चल् | √ दा | √ पत् | √ ज्ञा |
|---|---|---|---|
| पूर्वक्रिया | तुमन्तक्रिया | वर्तमानकालकृदन्त | अतीतकालकृदन्त |
| चलित्वा | दातुम् | पतन् / पतत् | ज्ञात |

(iii) පහත සඳහන් වගුව සුදුසු පරිදි සම්පූර්ණ කරන්න. *(ලකුණු 06 යි)*
Complete the following table suitably. *(06 marks)*

| आख्यातपद | लकार | वचन | अर्थ |
|---|---|---|---|
| अस्ति । | लट् | एकवचन | වෙයි |
| नयेत् । | विधिलिङ् | एकवचन | ගෙන යා යුතු යි. / ගෙන යන්නේ නම් මැනවි |

## 05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.8(a)

අංක 3.12 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 26%කි.
ලකුණු ලබා ගැනීමේ දී,
0 - 3 ප්‍රාන්තරයේ 41%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 30%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 23%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 6%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 6%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 41%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.



ප්‍රස්තාරය 3.8 (b)

- මෙම ප්‍රශ්නය කොටස් තුනකි. 05 (i) කොටස සඳහා පහසුතාව 22%ක් ද 05 (ii) කොටස සඳහා පහසුතාව 21%ක් ද 05 (iii) කොටස සඳහා පහසුතාව 35%ක් ද වේ.
- 1, 4, 6 හා 10 යන ධාතුගණ මගින් තැනෙන තුමන්ත, පූර්වක්‍රියා, වර්තමාන කෘදන්ත, අතීත කෘදන්තවලට අදාළ ධාතු 30ක් ප්‍රායෝගික ව පුහුණු කරවීමට යෝජනා කෙරේ.
- පෙළපොතෙහි සඳහන් ලකාර හා අර්ථ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට ද යෝජනා කෙරේ.

**06 ප්‍රශ්නය**

(i) **आसीत् कस्मिंश्चिद्दने विस्तीर्णा तृणभूमिः ।** යන පාඨයෙහි ඇති සමාසපදය කුමක් ද? *(ලකුණු 02 යි)*

What is the *samāsa* word in the phrase **आसीत् कस्मिंश्चिद्दने विस्तीर्णा तृणभूमिः ।** *(02 marks)*

**तृणभूमिः**

(ii) **धनिक - राजकीय - यत्र - गौतमः** මෙම වචන සුදුසු පරිදි වගුගත කරන්න. *(ලකුණු 04 යි)*

Complete the following table with the appropriate derivatives. *(04 marks)*

| अव्ययतद्धित | अपत्यतद्धित | अनेकार्थतद्धित | अस्त्यर्थतद्धित |
|---|---|---|---|
| यत्र | गौतम | राजकीय | धनिक |

(iii) පහත දැක්වෙන සමාසපද ඉදිරියෙන් සමාසනාමය ලියන්න. *(ලකුණු 06 යි)*
Write the name of the *samāsa* against each compound. *(06 marks)*

| | |
|---|---|
| रत्नत्रयम् । | ද්විගු සමාසය |
| रक्तपुष्पम् । | කර්මධාරය සමාසය |
| मृगराजः । | බහුව්‍රීහි සමාසය |
| अनुरथम् । | අව්‍යයීභාව සමාසය |
| चोरभयम् । | තත්පුරුෂ සමාසය |
| धर्मार्थकाममोक्षम् । | ද්වන්ද්ව සමාසය |

## 06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.9(a)

අංක 3.12 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 34%කි.

ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 38%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 31%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 14%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 17%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 17%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 38%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.9(b)

- මෙය සමාස හා තද්ධිත ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත ය. 06 (i) කොටස සඳහා පහසුතාව 35%ක් ද 06 (ii) කොටස සඳහා පහසුතාව 37%ක් ද 06 (iii) කොටස සඳහා පහසුතාව 31%ක් ද වේ.
- නිර්දිෂ්ට ග්‍රන්ථ තුළ ඇති සමාසපද හඳුනා ගැනීමේ කුසලතාව ප්‍රායෝගික ව පුහුණු කිරීමට යෝජනා කෙරේ.
- පෙළපොතෙහි හා නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි සමාස හා තද්ධිත ප්‍රභේදයන් හඳුනා ගැනීමේ පෙරහුරු අභ්‍යාස සිදුකිරීමට යෝජනා කෙරේ.

**07 ප්‍රශ්නය**

i) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න. *(ලකුණු 07 යි)*
Fill in the blanks with the appropriate words given within the brackets. *(07 marks)*

( प्रायात् - प्रतिदिनमेकाकी - क्षीरं - निवेद्य - पश्यति - क्षमस्व - दीनारमेकं )

तत्साम्प्रतं क्षमस्व इति। एवमुक्त्वा दग्धञ्च निवेद्य गृहाभिमुखं प्रायात्। अथ प्रातर्यावदागत्य पश्यति तावत् दीनारमेकं शरावे दृष्टवान्। एवं च प्रतिदिनमेकाकी समागत्य तस्मै क्षीरं ददाति, एकैकञ्च दीनारं गृह्णाति।

(ii) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. *(ලකුණු 05 යි)*
Answer the questions asked on the following paragraph. (05 marks)

कस्मिंश्चिदधिष्ठाने चत्वारो ब्राह्मणपुत्राः परस्परं मित्रभावमुपगता वसन्ति स्म। तेषां त्रयः शास्त्रपारङ्गताः,। परंतु बुद्धिरहिताः। एकस्तु बुद्धिमान्, केवलं शास्त्रपराङ्मुखः। अथ तैः कदाचिन्मित्रैर्मन्त्रितम् - 'को गुणो विद्याया येन देशान्तरं गत्वा भूपतीन्परितोष्यार्थोपार्जना न क्रियते ? तत्पूर्वदेशं गच्छामः'। तथाऽनुष्ठिते, किञ्चिन्मार्गं गत्वा तेषां ज्येष्ठतरः प्राह - 'अहो ! अस्माकमेकश्चतुर्थो मूढः केवलं बुद्धिमान्। न च राजप्रतिग्रहो बुद्ध्या लभ्यते विद्यां विना। तन्नास्मै स्वोपार्जितं दस्यामि। तद्गच्छतु गृहम्। ततो द्वितीयेनाभिहितम् - 'भोः सुबुद्धे ! गच्छ त्वं स्वगृहे, यतस्ते विद्या नस्ति।'

i. ශාස්ත්‍රයෙහි නිපුණ බ්‍රාහ්මණයෝ කීදෙනෙක් වෙත් ද?
How many Brahmins are skilled in science?

त्रयः / තිදෙනෙක්

ii. බුද්ධිමත් බ්‍රාහ්මණයෝ කීදෙනෙක් වෙත් ද?
How many intelligent Brahmins are there?

एकः /එක් අයෙක්

iii. ඔවුන් රැස් වී කථිකා කළේ කුමක් ද?
What they met and talked about?

වෙනත් රටකට ගොස් ධනය ඉපයීම නොකරනු ලබන්නේ නම් විද්‍යාවෙන් කවර ප්‍රයෝජනයක් වේද යනු යි.

'को गुणो विद्याया येन देशान्तरं गत्वा भूपतीन्परितोष्यार्थोपार्जना न क्रियते ?'

iv. ඔවුන් ගියේ කුමන දිශාවකට ද?
Which direction did they go?

पूर्वदेशं /පූර්වදේශයට, නැගෙනහිරට

v. දෙවැන්නා විසින් කියන ලද්දේ කුමක් ද?
What did the Second one say?
ඔබට ශාස්ත්‍රඥානය නැති හෙයින් ඔබ ගෙදර යන්න.

## 07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




ප්‍රස්තාරය 3.10(a)

අංක 3.12 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 43%කි.
ලකුණු ලබා ගැනීමේ දී,
0 - 3 ප්‍රාන්තරයේ 35%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 38%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 15%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 12%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 12%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 35%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




ප්‍රස්තාරය 3.10(b)

- මෙහි කොටස් දෙකකි. 07 (i) කොටසින් නිර්දිෂ්ට ගද්‍ය පාඨයක වාක්‍ය රටා පිළිබඳ අවබෝධය මැන බැලීම සිදු කෙරේ. එහි පහසුතාව 24%කි. 07 (ii) කොටසින් නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් කෙටි ලිඛිත ප්‍රශ්න 5ක් විමසා බලා ඇත. එම ප්‍රශ්නයෙහි පහසුතාව 07 (ii) (a) 50%ක් ද, 07 (ii) (b) 61%ක් ද 07 (ii) (c) 42% ක් ද, 07 (ii) (d) 48% ක් ද 07 (ii) (e) 37 %ක් ද වේ.

- නිර්දිෂ්ට ගද්‍යපාඨ ඇසුරින් ප්‍රශ්නපත්‍ර ආකෘතියට අනුරූප, ආකෘති සකසා සිසුන් ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීමට යෝජනා කෙරේ.

**08** ප්‍රශ්නය

(i) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න. *(ලකුණු 04යි)*
Translate the following sentences into English. (04 marks)

१. **सर्वे भद्राणि पश्यन्तु ।** සියලු දෙනා යහපත දකිත්වා.

२. **मम वचनं कः श्रुणोति ।** මගේ වචනය කවරෙක් අසයි ද?

३. **स्वस्रे पञ्चालिकां यच्छति ।** නැගණියට බෝනින්කෙකු දෙයි.

४. **तत्र कोऽपि सन्देहो नस्ति ।** එහි කිසිදු සැකයක් නොමැත.

(ii) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න. *(ලකුණු 04 යි)*
Translate the following sentences into Sanskrit. (04 marks)

i. ඇය එහෙ මෙහෙ ඇවිදියි.
She walks here and there.

**सा इतस्ततः चरति ।**

ii. ගෙදර කීදෙනෙක් වාසය කරත්ද?
How many people live at home ?

**कति गृहे वसन्ति ।**

iii. කවදාවත් දෙමාපියන් අමතක කරන්න එපා.
Never forget the parents.

**कदापि मातापितरं मा विस्मर ।**

iv. ඒ කැලෑවෙහි සිංහයෙක් වාසය කළේ ය.
A lion lived in that forest.

**तस्मिन् वने सिहः अवसत् ।**

(iii) චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය 04ක් දේවනාගරී අකුරෙන් ලියන්න. (එක ම වචනය දෙවරකට වඩා භාවිත නොකළ යුතු ය.) *(ලකුණු 04 යි)*

Write four sentences each consisting of not less than three words, on the following picture. Use *Devanāgarī* characters. (The same words should not be used more than twice). (04 marks)



.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

## 08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා



ප්‍රස්තාරය 3.11(a)

අංක 3.12 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 21% කි.

ලකුණු ලබා ගැනීමේ දී,

0-3 ප්‍රාන්තරයේ 43%ක් ද,
4-6 ප්‍රාන්තරයේ 37%ක් ද,
7-9 ප්‍රාන්තරයේ 15%ක් ද,
10-12 ප්‍රාන්තරයේ 5%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 5%කි. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 43%කි.



ප්‍රස්තාරය 3.11(b)

- මෙම ප්‍රශ්නයෙහි කොටස් අතුරෙන් පහසුතාව වැඩිම 08(iii) කොටසෙහි පහසුතාව 43%කි. පහසුතාව අඩුම 08(ii) C කොටසෙහි පහසුතාව 13%කි.
- සරල වාක්‍ය නිර්මාණකරණයට ශිෂ්‍යයන් පුහුණු කිරීමට යෝජනා කෙරේ.
- පින්තූර ආශ්‍රයෙන් වාක්‍ය නිර්මාණකරණයට අවශ්‍ය පුහුණු ක්‍රියාකාරකම් සිදු කිරීමට යෝජනා කෙරේ.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ප්‍රස්තාරය 3.12 (RD/16/4/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි)

II ප්‍රශ්න පත්‍රයෙහි පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. සියලු ම අපේක්ෂකයන් එම ප්‍රශ්නයට 100%ක පිළිතුරු සපයා ඇත. එහෙත් එහි පහසුතාව 27%කි. දෙවන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයක් වුවත් අපේක්ෂකයන්ගෙන් එම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 98%ක් පමණි. එහි පහසුතාව 41%කි. පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වන හෙයින්, මෙබඳු ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමේ පුහුණුව සිසුන් අතර සංවර්ධනය කිරීමට දැඩි අවධානයක් යොමු කළ යුතු බව පෙනේ. සමස්තයක් ලෙස පළමු හා දෙවන ප්‍රශ්න අනිවාර්ය ප්‍රශ්න වුවත්, ඒවායේ පහසුතාව 50%කට වඩා අඩු අගයක් වන බැවින් ඒ පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කළ යුතු කරුණකි.

තෝරාගත යුතු ප්‍රශ්න හය අතුරෙන් පහසුතාව වැඩිම හත්වන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 57%කි. එහෙත් පහසුතාව අඩු තෙවන හා සිව්වන ප්‍රශ්න තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය පිළිවෙළින් 70%ක් හා 62%ක් තරම් ඉහළ ප්‍රතිශතයක් වේ. මෙහි දී පහසුතාව වැඩි වුනත් ඇතැම් ප්‍රශ්න අපේක්ෂකයන් අතර ප්‍රකට නොවීම හේතුවෙන් එම ප්‍රශ්න තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු නොවන බව පැහැදිලි වේ. මේ හේතුවෙන් පරිවේණාචාර්යවරුන් විභාගය සඳහා පෙර සූදානම් කිරීමේ පෙරහුරු පරීක්ෂණ සඳහා අපේක්ෂකයන් යොමු කිරීමට කටයුතු කිරීම උචිත වේ.

තෝරාගත යුතු ප්‍රශ්න අතුරෙන් අඩු අපේක්ෂකයන් ප්‍රමාණයක් තෝරාගෙන ඇත්තේ අටවන ප්‍රශ්නයයි. අපේක්ෂකයන් අතුරෙන් 20%ක් එම ප්‍රශ්නය තෝරාගෙන ඇත. එහි පහසුතාව 21% කි. පරිවර්තන ශක්‍යතාව පරීක්ෂා කරනු ලබන එක ම ප්‍රශ්නය මෙය වේ. එසේම දේවනාගරී අක්ෂර රචනයෙහි කුසලතාව පරීක්ෂා කරනු ලබන්නේ ද මෙම ප්‍රශ්නය මගිනි. මේ පිළිබඳ ව අපේක්ෂකයන් අතර අඩු අභිරුචියක් දක්නට ලැබීම මේ සඳහා හේතුවක් විය හැකි ය. පාඨ ග්‍රන්ථයන්හි දක්වා ඇති අදාළ පාඩම් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් ඉගැන්වීමටත්, පින්තූර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් යෙදවීමටත් යෝජනා කරනු ලැබේ.

## 4 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

- අමතර ව කියවීම් කාලය සඳහා ලබාදෙන විනාඩි 10ක කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව ලබා දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත්, පමණක් යොදා ගත යුතු ය. (එම කාලය පිළිතුරු ලිවීමට යොදා නොගන්න.)

- **I** පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (**X**) පමණක් යෙදිය යුතු ය.

- ප්‍රශ්න සඳහා නියමිත කාලය කළමනාකරණය කර ගත යුතු ය.

- **II** පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

- පිළිතුරු ලිවීම සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රමාණය පමණක් නිසි ලෙස භාවිතයට ගත යුතු ය.

- ප්‍රශ්න පත්‍රයෙහි ලබා දී ඇති උපදෙස් නිසි ලෙස පිළිපැදිය යුතු ය.

- අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යයෙන් කළ යුතු ය.

- පිළිතුරු ලිවීමේ දී නිල් කාබන් පෑනක් පමණක් භාවිත කිරීම වඩා සුදුසු ය.

- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

- භාෂාවට ආවේණික පාරිභාෂික ශබ්ද පමණක් භාවිත කළ යුතු ය. උදා-:(ප්‍රථමා විභක්තිය/ කර්මධාරය/ ද්විගු)

- විභාග අංකය සඳහන් කළ යුතු සෑම ස්ථානයක ම පැහැදිලි ව හා නිවැරදි ව සටහන් කළ යුතු ය.

- ලියන ලද පිළිතුර ඉවත් කිරීමට අවශ්‍ය වූ විට තනි ඉරකින් කපා දමා තම අත්සන යෙදීම කළ යුතු ය.

- පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙළට ඇමිණිය යුතු ය.

## 5 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- අක්ෂරමාලාවේ ප්‍රධාන ප්‍රභේද හා අදාළ අක්ෂර ලිවීම, කියවීම හා නිවැරදි පිළි භාවිතය ආදිය හඳුනාගැනීමේ පුහුණුව ලබාදිය යුතු ය.
- එසේ ම ඒ ඒ අක්ෂර ප්‍රභේදයන්ට අදාළ අක්ෂර සංඛ්‍යාව පිළිබඳ ව ද අවබෝධය ඇති කිරීමට කටයුතු කළ යුතු ය.
- සංයුක්තාක්ෂර ලිවීමේ හා කියවීමේ ශක්‍යතාව සංවර්ධනය කළ යුතු ය.
- සන්ධි වර්ගීකරණයන්ට අදාළ මූලික අවබෝධය පාඨග්‍රන්ථ ආශ්‍රයෙන් හා ප්‍රායෝගික භාෂා ව්‍යවහාරය තුළින් ලබාදීමට කටයුතු කළ යුතු ය.
- සමාස හා තද්ධිත පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් අපේක්ෂා කරන අතර (බුද්ධධර්මය, ධර්මශාලාව, ලඞ්කාද්වීපය, දේශීය, විදේශීය, රාජකීය) වැනි ප්‍රායෝගික උදාහරණ ඔස්සේ ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතු ය.
- නාම වරනැගීම ඒකකයට අදාළ ව නාමයන් ලිඞ්ගභේදයට අනුව වර්ගීකරණය වන ආකාරය පිළිබඳ අවබෝධය ඇති කළ යුතු ය.
- ඒ ඒ විභක්ති හා ඒවායෙහි අර්ථයන් පිළිබඳ පුහුණුව තවදුරටත් සංවර්ධනය කළ යුතු ය.
- කෘදන්ත පිළිබඳ සිද්ධාන්තමය දැනුමට අමතර ව ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුහුණුව ඇති කළ යුතු ය.
- සියලු ම ව්‍යාකරණ, සිද්ධාන්තවලට අදාළ උදාහරණ හා භාවිතයන් නිර්දිෂ්ට පාඨග්‍රන්ථ මගින් ඉගැන්වීමට ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.
- නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පාඨයන් හි අර්ථය වාචෝද්ගත කිරීමට අමතර ව වාක්‍ය ඛණ්ඩ වශයෙන් පරිවර්තනය කිරීමේ ශක්‍යතාව ඇති කළ යුතු ය.
- පෙළපොතෙහි භාවිත මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත පරිවර්තනයට හා විචාරයට ලක් කිරීමට පුහුණුව ලබා දිය යුතු ය.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන් හි කතා පුවත් මාතෘභාෂාවෙන් ලිවීමට හා සිතුවමට නැගීමට නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම ආදි ක්‍රමවේද ඔස්සේ ඉගැන්විය යුතු ය.
- සාරස්වතයෙහි මූලික සූත්‍ර වාචෝද්ගත කරවීම හා ඒවායෙහි අර්ථය පුහුණු කරවිය යුතු ය.
- කාල තුනට අදාළ ව සරල වාක්‍යය මාතෘභාෂාවෙන් සංස්කෘතයට ද සංස්කෘතයෙන් මාතෘභාෂාවට ද පරිවර්තනය කිරීමේ ශක්‍යතාව සංවර්ධනය කළ යුතු ය.
- සංස්කෘත භාෂාවෙන් සරල ගද්‍ය නිර්මාණයක් කිරීමේ හැකියාව ඇති කළ යුතු ය.
- නිර්දිෂ්ට කාල අනුව ලකාර වර්ගීකරණයන්ට අදාළ මූලික රීති පිළිබඳ පුහුණුව ලබා දිය යුතු ය.
- නාම වරනැගීම පහසුවෙන් ලිවීමට, මතකයෙන් කීමට පුහුණුව ලැබෙන පරිදි ක්‍රියාකාරකම් හි යෙදවිය යුතු ය.
- ඡේද ඛණ්ඩ වටහා ගෙන ඒ ඔස්සේ අසන ප්‍රශ්නවලට පිළිතුරු ලියවීමේ පුහුණුව ලබා දිය යුතු ය.
- චිත්‍රයක් ආශ්‍රයෙන් සංස්කෘත වාක්‍ය නිර්මාණකරණයෙහි යෙදීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවර්ධනය කළ යුතුය.
- ප්‍රශ්නපත්‍ර ආකෘතියට අදාළ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ පුහුණුව ලබා දිය යුතු ය.

Printed by
Department of Examinations Press